www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආර්ථික අර්බුදය සහ යුද්ධය

## The economic crisis and war

**2008 ඔක්තෝබර් 24**

ලෝකයේ අවධානය ගෝලීය ආර්ථික අර්බුදය වෙත යොමුවී ඇති අවස්ථාවක එක්සත් ජනපදය ඉරාකය තුළ තම නව-විජිතවාදී යුද්ධය දිගටම කරගෙන යන අතර ඇෆ්ගනිස්තානය තුළ හා යාබද පකිස්තානු දේශසීමා ප්‍රදේශයන්හි තම මිලිටරි සාහසික ක්‍රියා උග්‍ර කර ඇත.

ප්‍රංස ප්‍රවෘත්ති ඒජන්සියට අනුව බ්‍රහස්පතින්දා අලුයම එක්සත් ජනපද ගුවන් යානයක්, පකිස්ථානයේ උතුරු වසිරිස්ථානයේ ගෝත්‍රික ප්‍රදේශයක පිහිටි මද්රාසා යනුවෙන් හැඳින්වෙන ආගමික පාසලකට, මිසයිල හතරක් එල්ල කිරීමෙන් පුද්ගලයින් 11ක් මරණයට පත්ව ඇත. සැප්තැම්බර් මස ආරම්භයෙන් පසු අඩුතරමින් එක් විශේෂ බලකා යුද සෙබලුන්ගේ කොමාන්ඩෝ ප්‍රහාරයක් ද ඇතුලත්වූ, පකිස්තානය තුලට එල්ලවූ එක්සත් ජනපද ප්‍රහාර මාලාවක මෑතම ප්‍රහාරය මෙයයි. එක්සත් ජනපදය ඇෆගනිස්ථානය තුල සිය වාඩිලාගැනීමේ යුද්ධය පකිස්ථානය තුලට පැතිරවීමේ දැනුවත් ප්‍රතිපත්තියක් මත පිහිටා කටයුතු කරන බව, ඇමරිකානු ගොඩබිම් හමුදා පකිස්ථානය තුල යොදා ගැනීමට ඉඩ සලසමින් ජනාධිපති බුෂ් පසුගිය ජූලියේදී අත්සන් කල රහස් නියෝගයක් පසුගිය මස එලිදරව්වීම මගින් මොනවට පැහැදිලි කෙරෙයි.

ඇෆ්ගනිස්ථානය තුලමත්, එක්සත් ජනපදය හා එහි නේටෝ සගයන්, විදේශීය වාඩිලාගැනීමට එරෙහිව පලල් වන ප්‍රතිරෝධී යුද්ධය පාලනය කිරීමේ උත්සාහයක් ලෙස, මිලිටරි හා මහජන ඉලක්ක වෙත කෙරෙන තම ප්‍රහාර උග්‍ර කර ඇත. නැගෙනහිර ඇෆගනිස්ථානය තුළ කොස්ට් ප්‍රාන්තයේ දී එක්සත් ජනපද ප්‍රධාන ඒකාබද්ධ හමුදාවන්ගේ රාත්‍රී ගුවන් ප්‍රහාරයකින්, පැහැදිලිව පෙනෙන ආකාරයට “මිතුරු ප්‍රහාර” සිද්ධියක දී, ඇෆ්ගන් සොල්දාදුවෝ නව දෙනෙක් මිය ගියහ. පසුගිය මාසවල දී එක්සත් ජනපද ගුවන් ප්‍රහාරවලින් මියයන සිවිල් ජන සංඛ්‍යාව තියුණු ලෙස ඉහළ ගිය අතර මෙයට තලිබාන් වාසස්ථානයක් යයි කියනු ලබන ස්ථානයකට එල්ල කරන ලද ප්‍රහාරයකින් සිවිල් වැසියන් 90කට වැඩි පිරිසක් මිය යාම ද ඇතුලත් ය. ඔවුන්ගේ බහුතරය ගැහැනුන් හා ලමයි වූහ.

පසුගිය පස් වසර තුල ඇමරිකානු හා නේටෝ ගුවන් ප්‍රහාර මගින් ඇෆ්ගන් සිවිල් වැසියන් 500ක් පමන ඝාතනය කර ඇති බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය වාර්තා කරයි. මෙය බොහෝවිට ඇත්ත මරන සංඛ්‍යාව විශාල ලෙස අඩු තක්සේරු කිරීමක් විය හැක. මක්නිසාද යත් *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පත බ්‍රහස්පතින්දා වාර්තා කල පරිදි, “මෙම නවතම ගුවන් ප්‍රහාර සිදුවූයේ ඇෆගනිස්තානය තුල යුද්ධය 2001 අග භාගයෙන්”, එනම් එක්සත් ජනපද ආක්‍රමනයේ මුල් මාස කිහිපයෙන්, “පසුව පැවති එහි උච්චතම අවස්ථාවට පැමින ඇති තත්වයක දී” ය.

ඇෆ්ගනිස්ථානය තුල එක්සත් ජනපද මිලිටරි හා දේශපාලන තත්ත්වයේ කුනුවීම ජනාධිපතිවරන ව්‍යාපාරයේ අවධානයට ලක්වී ඇති අතර එක්සත් ජනපද මැදිහත්වීමේ දැවැන්ත ඉහලදැමීමක් කරන බවට ශපථ කරමින් ඩිමෝක්‍රැටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂක බැරක් ඔබාමා මෙහි මූලිකත්වය ගෙන ඇත. බදාදා වර්ජිනියාවේ දී, මැතිවරන රැස්වීමක කථා කරමින් ඔහු ධවල මන්දිරය ජයගත් විගස ම, සමහරවිට 15,000කින් හෝ ඊටත් වැඩි සංඛ්‍යාවකින්, එක්සත් ජනපද හමුදා ශක්තිය වැඩි කිරීමට නියෝග කරන බව සඳහන් කලේය. “දැන් හමුදාව තර කිරීමේ ඉල්ලීමට ඇහුම්කන් දීමට වේලාවයි”, ඔහු ප්‍රකාශ කලේය. “මේ නිසයි මා අඩුතරමින් වැඩිපුර සේනාංක දෙක තුනක් වත් ඇෆ්ගනිස්ථානයට යවන්නේ.”

ඔබාමාගේ පදවි ප්‍රාප්තියෙන් මාස හයක් ඇතුලත, නව ජනාධිපතිවරයා දරුනු විදේශ ප්‍රතිපත්ති අර්බුදයකට ප්‍රතිචාර දැක්වීමක් ලෙස, ඇදහිය නොහැකි ආකාරයේ දැඩි සහ ජනප්‍රිය නොවන තීරන ගනු ඇති බවට, ඔහුගේ උප ජනාධිපති අපේක්ෂක සෙනෙට් සභික ජෝසප් බිඩෙන් සීටල් නුවර පැවති එක් අරමුදල් රැස්කිරීමේ අවස්ථාවක දී කල ප්‍රකාශය ඔබාමා “පූච්චානම් සහගත ඝෝෂාවක්” සේ සලකා ඉවත දැම්මේ ය. බිඩෙන් ගිනි පුපුරු ලෙස සැලකිය හැකි ස්ථාන පහක් -- එනම් මැද පෙරදිග, ඇෆ්ගනිස්ථානය, පකිස්ථානය, උතුරු කොරියාව හා රුසියාව -- සඳහන් කලේය.

බිඩෙන්ගේ ඒ ලේ සීතලවන සඳහන, තව දුරටත් හුදෙක් “පූච්චානම් සහගත ඝෝෂාවක්” නො වන බව *නිව්යෝර්ක් ටයිම්ස්* හි ධවල මන්දිර වාර්තාකරු වන ඩේවිඩ් ඊ. සැන්ගර් විසින් බ්‍රහස්පතින්දා එම පුවත්පතේ පල කරන ලද දීර්ඝ ලිපියකින් සනාථ කෙරුනි. ඔබාමා

හා ඔහුගේ රිපබ්ලිකන් පාක්ෂික විරුද්ධවාදියා, සෙනෙට් සභික ජෝන් මැකේන්, ඉදිරිපත් කරන විදේශ ප්‍රතිපත්ති ස්ථාවරයන් ගැන සාකච්ඡා කරමින්, සැන්ගර් ඔබාමා මැකේන්ටත් වඩා දරුනු යුදකාමී විලාසයක් පැහැදිලිව කියාපාන ප්‍රධාන ක්ෂේත්‍ර වෙත ඇඟිල්ල දිගු කළේය.

උදාහරනයක් ලෙස, ඉරානය සම්බන්ධයෙන් ගත් කල, මැකේන්ගේ ඡන්ද ව්‍යාපාරය යෝජනා කලේ තමන්ගේ දේශසීමාවන් තුලදී ම යුරේනියම් නිපදවීමට ඉරානයට ඉඩ හරින එකගතාවක් පිලිගැනීමට තමන් කැමතිවනු ඇති බව යි. එහෙත් ඔබාමාගේ ඡන්ද ව්‍යාපාරය ප්‍රවෘත්තිපත්‍ර වෙත පැවසූවේ ඔබාමාගේ ධවල මන්දිරය “ඉරානයට තම රට තුල යුරේනියම් නිෂ්පාදනයට ඉඩ නොදෙනු ඇත යන, බුෂ් පාලනාධිකාරය පැහැදිලිව ප්‍රකාශ කල එම දැඩි මතධාරී අදහසමයි”.

සැන්ගර් සටහන් කරගන්නා පරිදි, “මිලිටරි විකල්පයන් අපි මේසය මතින් ඉවත් කර නොගනිමු” යයි ඔබාමා ප්‍රකාශ කල අතර ඉරාන න්‍යෂ්ටික මධ්‍යස්ථානවලට පහරදීමට ගන්නා තීන්දුවක් සම්බන්ධයෙන් ඔහු එක්සත් ජාතින්ට “නිෂේධ බලය” නොදෙනු ඇත. සැන්ගර් තව දුරටත් පවසන්නේ, මිලිටරි ප්‍රහාරයක් සඳහා හැකියාව සම්පාදනය කරන “ද්වාරය” -- එනම් ඉරානය යුද අවියක් නිපදවීමට සෑහෙන තරම් න්‍යෂ්ටික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට සමත් වන මොහොත -- “ඊලග ජනාධිපති නිල කාලය තුල තරමක් කලින් ම මුනගැසෙනු ඇත්” යයි එක්සත් ජනපද බුද්ධි අංශයේ නිලධාරීන් කියා පාන බව යි.

එක්සත් ජනපදය, ඉරානයේ ඉන්ධන හා පිරිපහදු කරනු ලැබූ පෙට්‍රොලියම් ද්‍රව්‍ය ආනයනයන් මත සම්බාධක පැනවිය යුතු යයි ද ඔබාමා යෝජනා කර තිබේ. බුෂ් පාලන තන්ත්‍රය එවැනි ක්‍රියාවක් යෝජනා කිරීම තරම් දුර නොගිය බව පෙන්වා දුන් ඔහු මෙසේ ලියයිඃ “සම්බාධක, කෙසේ වෙතත්, යුද ක්‍රියාවකට සමාන විය හැකි ය.”

පකිස්තානය සම්බන්ධයෙන් සැන්ගර් මෙසේ ලියයිඃ “ඇමරිකානු හමුදා යවන බවට තර්ජනය කිරීමට මැකේන් මහතාට වඩා කැමැත්තෙන් සිටින්නේ ඔබාමා මහතා යි.”

ඔබාමා, මැකේන්ට වඩා අඩු නොවන තරමින්, ඇමරිකානු පාලක පන්තියේ නියෝජිතයෙක් සේ කතා කරයි. ගෝලීය ආර්ථික හා මූලෝපායික අවශ්‍යතා වශයෙන් තමන් දකින දෙයට අනුකූල වන පරිදි එක්සත් ජනපදයේ විදේශ සහ මිලිටරි ප්‍රතිපත්ති තීන්දු කරන්නේ මෙම පාලක පන්තිය යි.

ධවල මන්දිරය අත්පත් කර ගන්නේ කුමන ධනපති පක්ෂය ද යන කරුන නොතකා, පරිමානයෙන් ලෝකය ම අලලා ගත් නමුත් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ලෝක ආර්ථික තත්වයේ පිරිහීම මත කේන්ද්‍රගත වූ ආර්ථික අර්බුදය, නො වැලැක්විය හැකි ලෙස ම එම ප්‍රතිපත්ති වඩ වඩාත් කලහකාරී හා යුදකාමී දිශාවකට දුවවනු ඇත. ආර්ථික අර්බුදය ලෝක සම්බන්ධකම් තුලට වඩවඩාත් වැඩෙන ආතතියක තත්වයක් හා ප්‍රතිවාදී අධිරාජ්‍යවාදී හා ධනවාදී රටවල් අතර ගැටුමක් ඇතුලත් කරගනු ඇත.

මුල්‍ය පද්ධතියේ කලබගෑනියේ හා ආර්ථික කඩාවැටීමේ තත්ත්වයන් යටතේ එක්සත් ජනපදය, කලින් දශකයේ සිදුවූවාටත් වඩා වැඩියෙන් තම ආර්ථික පරිහානිය මිලිටරි ක්‍රම මගින් විස්ථාපනය කිරීමට උත්සුක වනු ඇත. ඉතිහාසයේ පාඩම් ඉගෙනීම අත්‍යවශ්‍ය ය. අවසානයට සිදුවූ සුවිශාල ලෝක ආර්ථික අර්බුදය -- 1930 ගනන්වල අවපාතය -- දෙවන ලෝක යුද්ධයේ වහ්නිජාලාවෙන් අවසන් වුනු, උත්සන්න වන මිලිටරි ඝට්ටන වැලක් දිග හැරියේ ය.

ගැඹුරුවන මන්දාවධමනයක හා වැඩෙන මිලිටරි සැහැසිකම්වල තත්වයක් යටතේ දිගහැරෙන 2008 ජනාධිපතිවරනය, ඔබාමා හා ඩිමොක්‍රැටික් පක්ෂය සම්බන්ධයෙන් තබන දේශපාලන මිථ්‍යාවන්ගේ දැවැන්ත අනතුර විදහාපායි. නැවත වතාවක්, ඇමරිකානු ජනතාවගේ යුධවිරෝධී මනෝගතිය ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ඩිමොක්‍රැටික් කන්ඩායම පසුපස පෙල ගැස්වීම මගින් පූදින්නටත් පෙර තලාදමා ඇත.

සිදුවීමට හැකි දෙය ලෙස වඩවඩාත් පැහැදිලිව පෙනෙන දෙය, ඔබාමා මැතිවරනය ජයග්‍රහනය කලහොත්, යුදවාදයට හා යුද්ධයට එරෙහි අරගලය සිදුවනු ඇත්තේ ඔහුගේ පරිපාලනයට එරෙහිව ය.

**බැරී ග්‍රේ**

© www.wsws.org